**බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව**
**හම්බන්තොට දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ජුනි 11 දින ද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2018 දෙසැම්බර් 31 දිනට බෙලිඅත්ත ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

| ගිණුම්කරණ අඩුපාඩුව | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී ගිවිසුම්ගත නොවූ එකතු වටිනාකම රු. 4,105,000 ක් වූ කර්මාන්ත 05 ක් සඳහා ණයහිමි ප්‍රතිපාදන වෙන්කර තිබුණි. | වගකීමක් නොමැතිව ණයහිමි ප්‍රතිපාදන සැලසිය යුතු නොවේ. | ව්‍යාපෘති සඳහා ඇස්තමේන්තු සකස් කර තිබූ බැවින් ණයහිමි ප්‍රතිපාදන වෙන් කරන ලදී |

**(ආ) නොසැසඳූ පාලන ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ගිණුම් විෂයයන් 04 කට අදාළ එකතුව රු. 56,616,446 ක් වූ ශේෂ, ඊට අදාළ උපයෝගී ලේඛන/ලේඛනවල දැක්වෙන ශේෂ අතර එකතුව රු. 5,851,733 ක අසමානතා පැවතුණි. | වෙනස්කම් සසඳා ශේෂ නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | ශේෂ සසඳා ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි |

**(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 272,101,949 ක් වූ ගිණුම් විෂයයන් 11 ක් සතුටුදායක ලෙස සංනිරීක්ෂණය කිරීමට නොහැකි විය. | ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | ඉඩම්වල අයිතිය තහවුරු කිරීම සඳහා ඔප්පුවල මුල් පිටපත් සභාව සතුව පවතින අතර, ඒවායේ නව තක්සේරුව ලබා ගැනීමට කටයුතු කළෙමි. අනිකුත් විෂයයන් සඳහා විස්තරාත්මක උපලේඛන හා කාල විශ්ලේෂණ පසුව ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |

**1.4 අනුකූල නොවීම**

**1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| | නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන ) රීති 193 | අයවැය සමඟ අය හා වැය විෂයයන් සසඳා අතිරික්තතා හා ඌණතා වලට හේතු දැක්වෙන ප්‍රකාශනයක් ඉදිරිපත් කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | අය හා වැය සම්බන්ධයෙන් අතිරික්තතා හා ඌනතා වලට හේතු දැක්වෙන ප්‍රකාශනයක් සකස් කිරීමට කටයුතු කරමි |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| (i) | මුදල් රෙගුලාසි 371 | අතුරු අග්‍රිමය අදාළ කාර්යය නිම කළ වහාම පියවිය යුතු වුවත්, රු. 43,535 ක අග්‍රිම සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | අත්තිකාරම් මුදල පියවීමට කටයුතු කරමි |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | මුදල් රෙගුලාසි 702(3) | කොන්ත්‍රාත් සම්බන්ධව අත්සන් කරනු ලබන ගිවිසුම්වල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී ගිවිසුම්වල පිටපත් විගණයට ඉදිරිපත් කරමි |
| (ඇ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය | සභාව සතු වාහන 03 ක ඉන්ධන දහනය පරීක්ෂා කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | වාහන 03 හි ඉන්ධන දහනය ඉදිරියේදී පරීක්ෂා කරමි |
| (ඈ) | දකුණු පළාත් ප්‍රධාන ලේකම්ගේ 2014 පෙබරවාරි 24 දිනැති අංක 01/2014 දරන චක්‍රලේඛය | ඇප තැබිය යුතු තනතුරකට අදාළව සේවක ඇප තැන්පත් කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී ඇප තැබීමට කටයුතු කරමි |
| (ඉ) | දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ 2010 දෙසැම්බර් 27 දිනැති අංක දපපා/පපාකො/ 2010/01 දරන චක්‍රලේඛය ------------------------ | | | |
| (i) | 04 ඡේදය | සභාව සතු කඩ කාමර 08 කින් එක්වන් මුදල් රු. 1,748,000 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | නව වෙළඳ සංකීර්ණයේ කඩ කාමර අංක 04 හා 08 බදුකරුවන් පිළිවෙළින් මාසිකව රු. 5,000 ක් හා රු. 10,000 බැගින්ද පුස්තකාල සායන ගොඩනැගිල්ලේ කඩ කාමර 01 හා 11 හි බදුකරුවන් මාසිකව රු. 20,000 බැගින් ගෙවීම් කරයි. කඩ කාමර 04 කට අදාළව ගෙවීම් කිරීමට දන්වන ලදී |
| (ii) | 05 ඡේදය | කඩ කාමර 53 ක ගිවිසුම් වසර 3 කට වරක් යාවත්කාලීන කර නොතිබුණි. | ගිවිසුම් යාවත්කාලීන කිරීමට කටයුතු කළ යුතුවේ. | ගිවිසුම් යාවත්කාලීන කිරීමට කටයුතු කරමි |

## 2. මූල්‍ය සමාලෝචනය

---------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

-------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.16,090,076 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 12,955,657 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

----------------------

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

-----------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 1,991,590 | 1,977,986 | 1,156,276 | 1,724,741 | 2,547,370 | 2,393,872 | 1,605,454 | 1,391,165 |
| කුලී | 9,458,458 | 8,512,046 | 8,256,408 | 1,610,164 | 10,178,040 | 10,337,145 | 9,745,997 | 2,488,957 |
| බලපත්‍ර ගාස්තු | 3,616,050 | 2,175,027 | 2,113,989 | 90,600 | 1,224,360 | 1,672,993 | 1,658,743 | 14,250 |
| වෙනත් ආදායම් | 88,890,716 | 71,866,661 | 57,241,166 | 34,114,397 | 15,318,810 | 15,374,285 | 4,811,347 | 10,562,938 |
| | 103,956,814 | 84,531,720 | 68,767,839 | 37,539,902 | 29,268,580 | 29,778,295 | 17,821,541 | 14,457,310 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

--------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට හිඟ ආදායම රු. 14,457,310 ක් වූ අතර, වර්ෂයේ බිල් කිරීම් රු. 84,531,720 ක් විය. ඒ අනුව වර්ෂය තුළ රැස්කළ යුතු සමස්ථ ආදායම රු. 98,989,030 ක් වුවද, වර්ෂය තුළ රැස්කරන ලද ආදායම රු. 68,767,839 ක් වීමෙන් ආදායම් රැස්කිරීමේ ප්‍රගතිය සියයට 69 ක් විය | හිඟ ආදායම් අයකර ගත යුතුවේ. | විගණන ඡේදය පිළිගනිමි |

### 2.2.3 වරිපනම් හා බදු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට හිඟ වරිපනම් හා බදු ආදායම රු. 1,391,165 ක් වූ අතර, වර්ෂයේ බිල් කිරීම් රු. 1,977,986 ක් විය. මේ අනුව වර්ෂය තුළ අයවිය යුතු වරිපනම් හා බදු ආදායම රු. 3,369,151 ක් වුවද, රැස්කළ ආදායම රු. 1,156,276 ක් වීමෙන්, වරිපනම් හා බදු ආදායම රැස් කිරීමේ ප්‍රගතිය සියයට 34 ක මට්ටමක පැවතුණි. | වරිපනම් හා බදු අය කිරීමේ ප්‍රගතිය වැඩිකරගත යුතුවේ. | වර්ෂය තුළ අයවිය යුතු වරිපනම් බදු රු. 2,990,513 ක් බව හා රැස්කළ ආදායම රු. 1,223,671 ක් වීමෙන් වරිපනම් බදු රැස් කිරීමේ ප්‍රගතිය සියයට 41 කි |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31දිනට ලැබිය යුතු වරිපනම් බදු රු. 1,703,520 ක් වූ ශේෂය තුළ වර්ෂ 02 ත් 04 ත් අතර හිඟ හිටි ශේෂය රු. 1,324,554 ක් විය | හිඟ ආදායම් අය කළ යුතුවේ. | විගණන ඡේදය පිළිගනිමි |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු අක්කර බදු රු .21,220 ක් 2019 මැයි 30 දින වන විටත් අයකර ගෙන නොතිබුණි. | හිඟ ආදායම් අය කළ යුතුවේ. | විගණන ඡේදය පිළිගනිමි |

### 2.2.4 කුලී

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත කුලී ආදායම රු. 9,458,458 ක් වූ අතර, බිල්කළ ආදායම රු. 8,512,046 ක් විය. වර්ෂය තුළ රැස්කළ ආදායම රු. 8,256,408 ක් වීම නිසා වර්ෂය අවසානයට හිඟය රු. 1,610,164 ක් විය. | ඇස්තමේන්තු නිවැරදිව සැකසිය යුතුවේ. | හිඟ කුලිය අයකර ගැනීමට කටයුතු කරමි |
| (ආ) | මෙම හිඟ කුලී ශේෂය තුළ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු කඩ කාමර කුලී රු. 707,562 ක් වූ අතර, එම හිඟය අයකර ගැනීම සඳහා ප්‍රාදේශීය සභා පනතේ 159(1) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | හිඟ කුලී අයකර ගත යුතුවේ. | හිඟ කුලී පවතින කඩ කාමර මුද්‍රා තැබීම වැනි කටයුතු කිරීමෙන් දැනටමත් හිඟයෙන් කොටසක් අයකර ගෙන ඇත. |

**2.2.5** **බලපත්‍ර ගාස්තු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත බලපත්‍ර ගාස්තු ආදායම රු. 3,616,050 ක් වූ අතර, බිල්කළ ආදායම රු. 2,175,027 ක් විය. මේ අනුව ඇස්තමේන්තුගත ආදායමින් සියයට 60 ක් පමණක් බිල්කිරීම් කර තිබුණි. | ඇස්තමේන්තු නිවැරදිව සැකසිය යුතුවේ. | 2018 වර්ෂයේ අයවැය සකස් කිරීමේදී වැඩිපුර ඇස්තමේන්තු කර තිබීමෙන් මෙම වෙනස ඇති වී ඇති අතර, ඉදිරියේදී එම දෝෂ නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු බලපත්‍ර ගාස්තු රු. 90,600 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ ආදායම් අයකර ගත යුතුවේ. | සමාලෝචිත වර්ෂයේ පැවති හිඟයෙන් රු. 14,200 ක් අය වී ඇති අතර, රු. 21,800 ක් කපා හැර ඇත. ඉතිරිය අයකර ගැනීමට නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන ලදී |

**2.2.6** **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු පිළිවෙලින් රු. 475,765 ක් හා රු. 30,431,396 ක් විය. | හිඟ උසාවි දඩ හා මුද්දර ගාස්තු අයකර ගත යුතුවේ. | හිඟ උසාවි දඩ වලින් රු. 393,478 ක් හා හිඟ මුද්දර ගාස්තුවෙන් රු. 3,606,522 ක් මේ වන විට අයවී ඇති අතර ඉතිරිය ගෙන්වා ගැනීමට ප්‍රධාන ලේකම් වෙත දන්වන ලදී |

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

**3.1** **කාර්ය සාධනය**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ)** **අත්හැර දැමූ කර්තව්‍යයන්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී කොම්පොස්ට් ව්‍යාපෘතියේ අපජලය පිරිපහදු ඒකකය සංවර්ධනය කිරීමේ කර්තව්‍ය ආරම්භ කර රු. | ශක්‍යතා අධ්‍යනයකින් පසුව කර්තව්‍යයන් ආරම්භ කළ යුතුවේ. | දිස්ත්‍රික් ඉංජිනේරු කළ ක්ෂේත්‍ර පරීක්ෂාවේදී මෙම ව්‍යාපෘතියට යෙදූ කම්බි ප්‍රමිතියෙන් තොර බැවින් ඒවා |

| | | |
|---|---|---|
| 300,000 ක් වැය කර තිබූ නමුත් 2018 දෙසැම්බර් 31 දින වන විටත් අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගෙන නොතිබූ අතර, එම ඉදි කිරීමට යොදාගත් කම්බි නිසි ප්‍රමිතියකට නොතිබීමෙන් කර්තව්‍යය අත්හැර දමා තිබුණි | | ඉවත් කර ප්‍රමිතියෙන් යුත් කම්බි යොදන ලෙස කොන්ත්‍රාත්කරුට දැනුම් දෙන ලදී. ඉන්පසු කොන්ත්‍රාත්කරු ඉදි කිරීම් අතරමඟ නවතා ඇති අතර ඒ සඳහා කිසිම ගෙවීමක් සභාවෙන් සිදු නොකරන ලදී |

**(ආ) කර්තව්‍යයන් ඉටු කිරීමේ ප්‍රමාදයන්**

**-----------------------------------**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| --------------------- | ----------- | ---------------------------- |
| සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනයේ ඇතුළත් එකතු වටිනාකම රු. 5,970,000 ක් වූ සංවර්ධන යෝජනා 16 ක් ක්‍රියාත්මක කර නොතිබුණි. | අයවැය ලේඛනයේ ඇතුළත් කර ඇති සංවර්ධන යෝජනා ඉටු කර ගැනීම කෙරෙහි අවධානය යොමු කළ යුතුවේ. | මෙම සංවර්ධන යෝජනා සභාවේ 06 වන වාරයේ මහා සභාව පත්වීමත් සමඟ සංශෝධනය කර ඇති අතර, 2018 ජූලි 23 දින මන්ත්‍රීන් ඉදිරිපත් කළ යෝජනා සම්මත කරගෙන ක්‍රියාත්මක කරන ලදී |

**(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක**

**---------------------------**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| --------------------- | ----------- | ------------------------------------ |
| තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුළින් සහා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් සභාව විසින් සකස් කර නොතිබුණි | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීමට දර්ශක හඳුනා ගෙන ඒ අනුව වාර්ෂිකව ඉලක්ක ළඟා කර ගැනීමේ ප්‍රගතිය මැනිය යුතුවේ. | තිරසර සංවර්ධන අභිමතාර්ථ ළඟා කර ගැනීම සඳහා විවිධ වැඩසටහන් වාර්ෂිකව සංවිධානය කර ඇති අතර 2030 තෙක් දිගු කාලීන තිරසර සංවර්ධන සැලැස්ම සකස් කිරීමට කටයුතු කරමි |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| --------------------- | ----------- | ---------------------------------- |
| (අ) 2014වර්ෂයේදී පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයෙන් කොඩි කණු 600ක් සභාවට ලබා දී තිබූ අතර ඉන් බාහිර පාර්ශවයන්ට නිකුත් කර තිබූ කොඩි කණු 279 ක් නැවත සභාවට ලබා ගැනීමට සමාලෝචිත වර්ෂයේදීත් කටයුතු කර නොතිබුණි. | බාහිර පාර්ශවයන්ට ලබා දී ඇති කොඩි කණු සභාවට නැවත ගෙන්වා ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුවේ. | ප්‍රදේශයේ අවශ්‍යතා සඳහා ලේඛනගතව කොඩි කණු 279 ක් නිකුත් කර ඇති අතර ඒවා ගෙන්වා ගැනීමට අදාළ පාර්ශවයන්ට ලිඛිතව දැනුම් දෙන ලදී |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2017 හා සමාලෝචිත වර්ෂයේදී ප්‍රාදේශීය සභා පිවිසුම් දොරටුව අසළ ප්‍රදර්ශනය කරනු ලබන විද්‍යුත් ප්‍රචාරක දැන්වීම් පුවරුවට අදාළව ගිවිසුමකට එළඹීම හෝ තාවකාලික තක්සේරුවක් මත බිම් කුලියක් අයකිරීමට පියවර ගෙන නොතිබුණි. | ගිවිසුමකට එළඹීම හෝ තක්සේරුවක් මත බිම් කුලියක් අය කළ යුතුවේ. | විද්‍යුත් ප්‍රචාරක දැන්වීම් පුවරුව සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවෙන් රු. 2,100 ක මාසික තක්සේරුවක් ලබාගෙන ඇති අතර නව ගිවිසුමකට එළඹීමට අදාළ පාර්ශවයන්ට දැනුම් දෙන ලදී |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදී සභාවේ වාහන 07 කට අදාළව ආදායම් බලපත්‍ර ලබා ගෙන නොතිබුණි | වාර්ෂික ආදායම් බලපත්‍ර ලබාගත යුතුවේ. | අංක RX – 2058 දරන ජල බවුසරය සඳහා ආදායම් බලපත්‍රය ලබාගෙන ඇති අතර ඉදිරියේදී අනෙකුත් වාහන සඳහාද බලපත්‍ර ලබා ගැනීමට කටයුතු කරමි |
| (ඈ) | ශක්‍යතා අධ්‍යනයකින් තොරව මිලදී ගත් කළමනාකරණ තොරතුරු පද්ධතිය 2019 මාර්තු 21 දින වන විටත් අක්‍රීයව පැවතුණි. | කළමනාකරණ තොරතුරු පද්ධතියේ ක්‍රියාකාරීත්වය ප්‍රශස්ථ මට්ටමක පවත්වා ගත යුතුවේ. | පද්ධතියට පිවිසීමේ ගැටළුව මේ වන විට නිවැරදි කර ගෙන ඇති අතර, දැනට ක්‍රියාකාරී තත්ත්වයේ ඇත |
| (ඉ) | ආයතනයේ සියලු දත්ත හා තොරතුරු සේවා සපයන්නාගේ සර්වරය තුළ (Server) ගබඩාකර තිබීම නිසා සභාවේ දත්ත හා තොරතුරු වල ආරක්ෂාව ,රහස්‍යභාවය හා නිරවද්‍යතාවය සම්බන්ධයෙන් අවධානමක් පැවතුණි. | සභාවේ දත්ත හා තොරතුරුවල ආරක්ෂාව, රහස්‍යභාවය හා නිරවද්‍යතාවය සඳහා කටයුතු කළ යුතුවේ. | මිලදී ගත් ආයතනය විසින් නව නිලධාරීන්ට පුහුණුව ලබා දීම අවසන් වූ වහාම අදාළ පද්ධතිවල ආරක්ෂාවට අදාළ සර්වරය ආයතනයට ලබා දීමට එකඟ විය |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

--------------------------------

| | විගණන නිරීක්ෂණය<br>---------------------- | නිර්දේශය<br>----------- | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම<br>---------------------------- |
|---|---|---|---|
| (අ) | අනුමත තනතුරුවල පැවති පුරප්පාඩු 10 ක් සම්පූර්ණ කර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි. | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීම කළ යුතුවේ. | පුස්තකාල සහායක පුරප්පාඩුව හා වැඩ/ක්ෂේත්‍ර කම්කරු පුරප්පාඩුව මේ වන විට සම්පූර්ණ කර ඇති අතර අනෙක් පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කරමි |
| (ආ) | සභාවේ නිලධාරීන් 06 දෙනෙකු අනුමත රාජකාරි වලින් බැහැර රාජකාරිවල යොදවා තිබුණි | නිලධාරීන් අනුමත රාජකාරිවල යෙදවිය යුතුවේ. | තනතුරුවල පවතින පුරප්පාඩු හා දැනට සිටින නිලධාරීන් හට අධික රාජකාරි ප්‍රමාණයක් පැවරී ඇති නිසා මෙම නිලධාරීන් වෙනත් රාජකාරිවල යොදවන ලදී |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ඉකුත් වර්ෂවලදී සභාවේ සේවයෙන් ඉවත්ව ගිය සේවකයින් දෙදෙනෙකුගේ සේවක ඇප රු. 13,948 ක් නිරවුල් කර නොතිබුණි. | සේවක ඇප නිරවුල් කළ යුතුවේ. | මෙම සේවකයින් ලබා දී ඇති ලිපිනයන්හි දැනට පදිංචිව නොමැති බැවින් සේවක ඇප නිරවුල් කිරීමට නොහැකි වූ අතර ඔවුන්ගේ තොරතුරු ලැබුණු පසු මෙම ඇප මුදල් නිරවුල් කිරීමට කටයුතු කරමි |

## 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් නොකළ කර්මාන්ත 12 කට අදාළව වෙළඳ බලපත්‍ර ලබා දී තිබුණි. | පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාදීම කළ යුතුවේ. | පරිසර ආරක්ෂණ බලපත්‍රය ලබා ගන්නා ලෙසට කර්මාන්ත හිමියන් දැනුවත් කරන ලදී |
| (ආ) | වලංගු කාලය ඉක්මවා තිබූ කර්මාන්ත 05 කට අදාළව නැවත පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීමට හෝ එම කර්මාන්ත වල වත්මන් තත්ත්වය සොයා බැලීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාදීම කළ යුතුවේ. | පරිසර ආරක්ෂණ බලපත්‍රය අලුත් කරන ලෙසට කර්මාන්ත හිමියන්ට දන්වන ලදී |

## 3.5 වත්කම් කළමනාකරණය

### 3.5.1 නඩත්තු හා අළුත්වැඩියා සිදුනොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව සතු වාහන 03 ක් දීර්ඝ කාලයක සිට අක්‍රීයව පවතින අතර ඒවා අළුත්වැඩියා කිරීම හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | අපහරණය කිරීමට හෝ අළුත්වැඩියා කිරීමට කටයුතු කළ යුතුවේ. | යාන්ත්‍රික ඉංජිනේරුවරයාගේ නිර්දේශ අනුව ඉදිරියේදී කටයුතු කරමි |

### 3.5.2 පවරා නොගත් වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වාහන 12 ක අයිතිය සභාව වෙත පවරා ගෙන නොතිබුණි | වත්කම් පවරා ගැනීම කළ යුතුවේ. | සභාව සතු වාහන වලින් වාහන 03 ක් සඳහා අයිතිය පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමි |

### 3.5.3 නිෂ්ක්‍රීය/ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවේ කුට්ටිගල් නිෂ්පාදන වැඩපලෙහි හා කොහුමෝල කර්මාන්තයට අයත් මෝටර් 02 ක්, ලීටර් 1000 බැරලයක් සහ කුට්ටිගල් නිෂ්පාදිත යන්ත්‍රය දීර්ඝ කාලයක සිට නිෂ්කාර්යව පැවතුණි. | වත්කම් ප්‍රයෝජනයට ගත යුතුවේ. | කොහු නිෂ්පාදනය සඳහා විශාල මුදලක් වැය වීම හා ඒ සඳහා සාධාරණ මිලක් නොමැති වීම නිසා නිෂ්පාදන ක්‍රියාවලිය නතර කර ඇති අතර, කුට්ටි ගල් නිෂ්පාදන ව්‍යාපෘතිය නැවත ආරම්භ කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලදී |

### 3.5.4 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2017 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා මගින් ඌන භාණ්ඩ ලෙස හඳුනාගත් වොයිස් රෙකෝඩරය හා USB වාජරයක් සම්බන්ධයෙන් වූ නිර්දේශ 2019 අප්‍රේල් 09 දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි. | භාණ්ඩ සමීක්ෂණ නිර්දේශ ක්‍රියාත්මක කළ යුතුවේ. | USB වාජරය ගෙන්වා ගැනීමට දැනුම් දෙන ලදී |

### 3.6 ප්‍රසම්පාදනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් 2017 වර්ෂයේදී M code IT solutions පුද්ගලික ආයතනයෙන් වටිනාකම රු. 720,000 ක් වූ කළමනාකරණ තොරතුරු පද්ධති 04 ක් ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමකින් තොරව මිලදී ගෙන තිබුණි. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කළ යුතුවේ. | හම්බන්තොට පළාත් පලාන සහකාර කොමසාරිස්ගේ 2017 සැප්තැම්බර් 06 දිනැති අංක හපපා/ඩී/පපා ආ.ම.සේ.වි දරන ලිපිය මත සූරියවැව ප්‍රාදේශීය සභාව කළමනාකරණ තොරතුරු පද්ධති මිලදීගත් ආයතනයෙන්ම එම මිල ගණන් යටතේම මිලදී ගැනීමට අනුමැතිය ලැබී තිබුණි |

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**4.1 අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ආදායම් විෂයයන් 02 ක අහිතකර විචලනයන්ගේ එකතුව රු. 14,461,450 ක් වූ අතර, එය සියයට 20 සිට සියයට 77 ක් දක්වා පරාසයක විය. | තාත්විකව ඇස්තමේන්තු පිළියෙල කළ යුතුවේ. | සමාලෝචිත වර්ෂයේ අයවැය ගත ආදායම් හා වියදම් අතර පවතින විචලනයන් නිවැරදි කිරීමට කටයුතු කරමි |
| (ආ) | වියදම් විෂයයක අහිතකර විචලනය රු . 1,360,759 ක් වූ අතර එය සියයට 30 ක් විය. | | |